අධ්‍යාපන අමාත්‍යාංශය

# අනුහුරු ප්‍රශ්න පත්‍රය (සාමාන්‍ය පෙළ) විභාගය 2018

**චිත්‍ර I** **පැය එකයි**

**සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

විභාග අංකය ...............................................

---

- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කර ගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



1. ඉහත ඡායාරූපයෙන් දක්වෙන ප්‍රතිමාව ................................................................ නමින් හැඳින්වේ.
2. මෙම ප්‍රතිමාව අනුරාධපුර ............................................................ විහාර භූමියෙන් හමුවේ.
3. හිඳි ඉරියව්ව සහිත බුද්ධ ප්‍රතිමාවේ ආසන ක්‍රමය ............................................ යනුවෙන් හඳුන්වයි.
4. මෙම ප්‍රතිමාව ..................................................... ශිල්ප ක්‍රමයට අනුව පූර්ණ උන්නතව නිර්මාණය කර ඇත.
5. උසස් නිමාවෙන් යුතු මෙම බුද්ධ ප්‍රතිමාවේ කලා ලක්ෂණ ඉන්දියාවේ ............................................... කලා සම්ප්‍රදායට අයත් බව විද්වත් මතය යි.

- **අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

6. ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් අතර පේකඩ නිර්මාණ සඳහා යොදා ඇති මල් මෝස්තරය වන්නේ කුමක් ද?
   ........................................................................................

7. සාංචි තොරනේ උඩලිපත් කෙළවර තුරුලතා සමඟ අලංකාර වස්ත්‍රාභරණයෙන් යුතුව නිරූපණය කර ඇති රූප හඳුන්වන්නේ කවර නමකින් ද?..............................................................................

8. පුනරුද යුගයේ ශිල්පීන් අතර ලියනාඩෝ ඩාවින්චි විසින් අවසාන භෝජන සංග්‍රහය සිතුවම සඳහා භාවිත කරන ලද වෙනස් ශිල්ප ක්‍රමය වන්නේ කුමක් ද? ........................................................................................................

9. ජෝර්ජ් කීට් විසින් බොරැල්ලේ ගෝතමී විහාරයේ අඳින ලද සිතුවම් අතර ඝනිකවාදී ලක්ෂණ වඩාත් ප්‍රකට කරවන සිතුවම වන්නේ කුමක් ද ? ........................................................................................

10. තිස්ස රණසිංහ හා ඒ. මාර්ක්ගේ නිර්මාණවල දිගටි, සිහින් හා විවර හැඩ සඳහා අභාසය ලද යුරෝපීය නිර්මාණ ශිල්පියා වන්නේ කවුරුන් ද ? ...................................................................................................................

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. අනුරාධපුර තිසා වැව අසල රන් මසු උයනට දකුණින් පිහිටා ඇති විවිධ කලා සම්ප්‍රදා ලක්ෂණ සහිත කැටයම් ....................................................... විහාරය ආශ්‍රිත ව දැකිය හැකි ය.

12. පද්මාසන ක්‍රමයෙන් හා ................................................... මුද්‍රාවෙන් නිරූපිත සාරනාත් බුද්ධ ප්‍රතිමාව ගුප්ත කලා සම්ප්‍රදායට අයත් නිර්මාණයකි.

13. අජන්තා චිත්‍ර අතර දකුණතින් නිල් මහනෙල් මලක් සහිත ............................................. හැඩයෙන් යුතු රුව පද්මපානි බෝසත් රුව ලෙස හැඳින් වේ.

14. ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන්ගේ රුව සහ බිම වැතිරී සිටින මිනිසකුගේ රුව සහිත දඩයම් දර්ශනයක් දක්වන සිතුවම ........................................................ගුහාවේ දැක ගත හැකි ය.

15. දියසායම් ශිල්ප ක්‍රමයෙන් හා ශාස්ත්‍රාලයීය චිත්‍රකලාවේ ................................................................ ශෛලිය ලක්ෂණයන්ගෙන් සමන්විත සිතුවම් ශිල්පියකු ලෙස පී.එස් ප්‍රනාන්දු හැඳින් වේ.

- **අංක 16 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට A,B,C,D,E යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

16. A අක්ෂරයෙන් දැක්වෙන සිතුවම කාගේ නිර්මාණයක් ද? ..........................................................................................

17. B අක්ෂරයෙන් නිරූපිත ග්‍රීක මූර්තිය කුමන කලා යුගයට අයත් වූවක් ද? ..........................................................

18. C අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න ශිෂ්ටාරයට අයත් නිර්මාණය කුමන නමකින් හැඳින්වේ ද?
    ......................................................................................

19. ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් හි කලාගාරයක ප්‍රදර්ශනයට තබා ඇති Dඅක්ෂරයෙන් දැක්වෙන පැබ්ලෝ පිකාසෝගේ සිතුවම කුමන ශිල්ප ක්‍රමයකට අයත් ද? ......................................................................................

20. E අක්ෂරයෙන් දැක්වෙන සිතුවමෙහි පසුබිම් අවකාශය සඳහා ලද කලා ආභාසය කුමක් ද? .................................

- අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති F,G,H,I,J යන රූප සටහන් අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21.  (......................)  F

22.  (......................)  G

23.  (......................)  H

24.  (......................)  I

25.  (......................)  J

- **අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

26. ප්‍රකාශන චිත්‍රයකට වඩා පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීමේ දී ඉතා වැදගත් කොට සැලකිය යුත්තේ,
   (1) වේගවත්ව පණිවිඩය ග්‍රහණය කිරීමට හැකි පැහැදිලි හා සරල දැක්වීම ය.
   (2) හැඟීම් මතු කරන ලෙස හැඩතල ස්වභාවිකව යෙදීම ය.
   (3) පර්යාවලෝක හා ත්‍රිමාන ලක්ෂණ සහිත ව වර්ණ යොදා ගැනීම ය
   (4) අකුරු භාවිතය සමඟ විස්තරාත්මක සැරසිලි අංග යොදා ගැනීම ය.

27. අජන්තා චිත්‍ර සමඟ සැසඳීමේ දි සිගිරි චිත්‍රවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වනුයේ,
   (1) සෑම ඉරියව්වකම ඉදිරි පස හා පසුපස ස්වරූපයට පමණක් ඇඳ වර්ණ කර තිබීම යි.
   (2) ජීව ගුණයෙන් හා ලාලිත්‍යයෙන් යුතු ව සමස්ත ශරීර රූප නිරූපණය කර තිබීම යි.
   (3) එකිනෙකට වෙනස් ලක්ෂණ සහිත ව කාන්තා උඩුකය රූප පමණක් දක්වා තිබීම යි.
   (4) සංගත හා විසංගත වර්ණ සමඟ අලංකරණ රූප දක්වන පසුබිමක් සකස් කර තිබීම යි.

28. ලාංකේය නූතන සන්නිදර්ශන චිත්‍ර කලාවේ විවිධ ජාතීන්ට අයත් ක්‍රියාකාරී ශිල්පීන් දෙදෙනෙකු වන්නේ,
   (1) මුදලිඳු අමරසේකර හා ඩේවිඩ් පේන්ටර් ය.
   (2) වී. සිවසුබ්‍රමනියම් හා සුමන දිසානායක ශිල්පින් ය.
   (3) තාවඩි මු. තුරේසාමි හා ඇම්. සාර්ලිස් ය.
   (4) සී. ශිවඥානසුන්දරම් හා සෝලියස් මෙන්ඩිස් ය.

29. මහනුවර සම්ප්‍රදායේ විහාර සිතුවම් අතරින් පහතරට විහාර සිතුවම් වෙනස් වනුයේ,
   (1) තිරූ චිත්‍ර සමඟ ජාතක කතා පමණක් ඇඳීම නිසා ය.
   (2) ජාතක කතා සඳහා විහාර සිවිලිම භාවිතය නිසා ය.
   (3) රතු වර්ණයට පමණක් පසුබිම දැක්වීම සීමා වූ නිසා ය.
   (4) බිතු සිතුවම් සඳහා කාලීන ලක්ෂණ එකතු වීම නිසා ය.

30. පොලොන්නරුවේ තිවංක පිළිමගෙයට සාපේක්ෂ ව ගම්පොළ ගඩලාදෙණි විහාරයේ දැකිය හැකි සුවිශේෂ වාස්තු විද්‍යා ලක්ෂණ වන්නේ,
   (1) දකුණු ඉන්දියානු හා මහයාන කලා සම්ප්‍රයන් ය.
   (2) අභ්‍යන්තර බිතු සිතුවම් හා බාහිර බිතු කැටයම් ය.
   (3) ත්‍රිත්ව කුලුනු හා කලු ගල් භාවිත ය.
   (4) ශිඛර සහිත වහල හා ගඩොල් භාවිත ය.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

31. වයනය ..........................................................................................................................................

32. පංචනාරි ඝටය ..........................................................................................................................................

33. මීනාර් ..........................................................................................................................................

34. ඝන කැපීම ..........................................................................................................................................

35. සුන්දර මූර්ති ස්වාමි ..........................................................................................................................................

- **ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනා ගෙන එහි කලාත්මක අගය විග්‍රහ කරන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය 05ක් ලියන්න.**



36. හඳුනාගැනීම (ස්ථානය, ශිල්පියා හා නිර්මාණයේ නම සහිත ව)

:..........................................................................................................................

..........................................................................................................................

37. ආභාසය :..........................................................................................................................

..........................................................................................................................

38. වර්ණ භාවිතය :..........................................................................................................................

..........................................................................................................................

39. රූප සම්පිණ්ඩනය :..........................................................................................................................

..........................................................................................................................

40. හැගීම්/ භාව ප්‍රකාශනය :..........................................................................................................................

..........................................................................................................................

අධ්‍යාපන අමාත්‍යාංශය

# අනුහුරු ප්‍රශ්න පත්‍රය (සාමාන්‍ය පෙළ) විභාගය 2018

**චිත්‍ර III** **පැය දෙකයි**

---

**සැලකිය යුතුයි**

අ, ආ, ඉ යන කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**අ කොටස - චිත්‍ර සංරචනය**

1. ආගමික සිද්ධාස්ථානයක් තුළ පුද පූජාවල යෙදෙන බැතිමතුන්

2.දිය ඇල්ලක සුන්දරත්වය විදින සංචාරක පිරිසක්

3.කෘෂිකාර්මික දිවි පෙවතක නියලි සිටින ගොවියන්

4. නගරයක කලබලකාරි මොහොතක්

**ආ කොටස**

5. ඇන්තුරියන් මල හෝ අරලිය මල නිර්මාණාත්මකව යොදාගනිමින් කාන්තාවන් සඳහා සුදුසු රෙදි මෝස්තරයක් නිර්මාණය කරන්න.

6. සම්මත දේශිය සැරසිලිවල එන සත්ත්ව රූප ඇසුරින් කුෂන් කවරයක් නිර්මාණය කරන්න.

7. විදුලි මේස ලාම්පුවකට උචිත හැඩයක් චිත්‍රණය කරන්න.

**ඉ කොටස**

8. දේශිය නිශ්පාදනයකට ඇසුරුමක් සඳහා සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න.

9. ජලය අපගේ ජිවයයි යන තේමාව යටතේ පොස්ටරයක් නිර්මාණය කරන්න.

10.ඔබගේ පාසලේ චිත්‍ර කලා සංගමය සඳහා නව ලාංචනයක් නිර්මාණය කරන්න.